**මොරටුව මහා නගර සභාව**

මොරටුව මහා නගර සභාවේ බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුරු සඳහා (විවෘත) අයදුම්පත් කැඳවීම

මොරටුව මහා නගර සභාවේ බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු III ශ්‍රේණියේ තනතුරෙහි පවතින පුරප්පාඩු 08ක් (විවෘත පදනමින් ) සඳහා සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමට පහත සුදුසුකම් ඇති තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඉහත තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති පුද්ගලයන් මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් 2026.10.17 දිනට හෝ ඊට පෙර නාගරික කොමසාරිස්, මොරටුව මහා නගර සභාව, මොරටුව යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරය වම්පස උඩ කෙළවරේ **" බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

**2. බඳවා ගැනීමේ සුදුසුකම් :**

2.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය

2.2 අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබිය යුතුය. (මින් විෂයන් පහක් (05) එකවර සමත් වී තිබිය යුතුයි.)

**2.3 වෘත්තීය සුදුසුකම් :-**

I. බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොන්ඩර් 34 වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32ට වඩා ගෙන යා හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් හෝ “ඒ” පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව “ඩී” පන්තියේ බලපත්‍රයක්) ලබා තිබිය යුතුය.

II. අවම උස අඩි 5ක් විය යුතුය

III. බර යන්ත්‍ර / ගල් රෝල් ක්‍රියාකරවීම පිළිබඳව තෘයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද NVQ 04 මට්ටමට අදාළ සහතිකපතක් තිබිය යුතුය.

IV. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතුය.

**2.4 පළපුරුද්ද :-**

බර යන්ත්‍රෝපකරණ / ගල් රෝල් ක්‍රියාකරවීම පිළිබඳව එක් වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**2.5 කායික සුදුසුකම් :-**

සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීටමත් තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**2.6 වෙනත් සුදුසුකම් :-**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

III. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

IV. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට මෙම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**2.7 වයස :-**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**3. බඳවා ගැනීමේ ක්‍රමය :**

3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහිදී සලකා බැලේ.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර :**

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| මාර්ග නීති පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම | 30 | 50% |
| යාන්ත්‍රික ක්‍රියාකාරිත්වය හා එහි පැවැත්ම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම | 50 | |
| ප්‍රායෝගික පරීක්ෂණය<br>බඳවා ගැනීමට යෝජිත බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවීම පිළිබඳ අයදුම්කරුගේ ශිල්පීය හැකියාව හා ප්‍රවීණතාව මෙහිදී පරීක්ෂා කරනු ලැබේ. | 15 | |
| පෞරුෂත්වය<br>සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය මෙහිදී පරීක්ෂා කරනු ලැබේ. | 05 | |

3.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-

මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කරනු ලැබේ.

4. වැටුප් කාණ්ඩය සහ පරිමාණය :

වැටුප් කේත අංකය : PL 3 - 2025

වැටුප් පරිමාණය : රු. 42,780- 10x490 – 10x540 – 10X590 – 12X630 - රු. 66,540/-

5. භාෂා ප්‍රවීණතාවය :

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාවය* |
|---|---|
| දෙවන භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |
| සන්ධාන භාෂාව | අදාළ නොවේ. |

**6. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :**

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

II. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

III. මෙම තනතුරට බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් කලින් කළ පනවනු ලබන නියමයන්ට හා රෙගුලාසිවලට ද යටත්ව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

**7. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

I. අයදුම්පත් 2026.10.17 දිනට හෝ ඊට ප්‍රථම නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මොරටුව යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

III. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ " බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුර සඳහා බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම " යනුවෙන් සඳහන් කළ යුතුය.

IV. මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම් ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**08. සාවද්‍ය තොරතුරු සැපයීම**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍යය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

09. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීම සම්බන්ධයෙන් ද මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව ද තීරණය ගැනීමේ බලය මොරටුව මහා නගර සභාව සතු වේ.

10. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

එල්. පී. මනෝජා එස් පතිරණ,
නාගරික කොමසාරිස්,
මොරටුව මහා නගර සභාව.

2026 සැප්තැම්බර් මස 18 වන දින,
මොරටුව මහා නගර සභාවේ දී ය.